# මෝක්ෂය පිළිබඳ බෞද්ධ හා දේවවාදී ආගම්වල විවරණය

මැදවච්චියේ ධම්මජෝති හිමි
කථිකාචාර්ය පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය
කොළඹ විශ්ව විද්‍යාලය

දේවවාදී ආගම්වල මෝක්ෂය වශයෙන් ගනු ලබන්නේ ස්වර්ගය යි. නැතහොත් දේව සහව්‍යතාව යි. දෙවියන් හා සදකාලිකව ස්වර්ගයේ සැප විඳීම සඳහා මිනිසා විසින් කළ යුත්තේ එම දෙවියන් සතුටු කිරීම යි. එමනිසා දේවවාදී සියලු ම ආගම්වල ලෝකය හා සත්වයා පිළිබඳ සියලු ක්‍රියාකාරකම් පමණක් නොව මෝක්ෂය ද දේව කේන්ද්‍රීයව විග්‍රහකර තිබේ. නමුත් මානව කේන්ද්‍රිය වූ බුදුදහම සත්වයා හා ලෝකය පිළිබඳ ක්‍රියාකාරකම් මෙන්ම මෝක්ෂය පිළිබඳ සියලු වගකීම් ද පවරා තිබෙන්නේ මිනිසාට ම ය. එය සදකාලික සැපතක් වශයෙන් සාපේක්ෂකව හඳුන්වා ඇති අතර ස්වර්ගය ත්‍රිලක්ෂණයට යටත් වෙනස්වන ලෝකයක් වශයෙන් විග්‍රහකර තිබේ. එමනිසා දේවවාදී ආගම්වලට වඩා බුදුදහම ස්වර්ගය හා මෝක්ෂය සම්බන්ධයෙන් දර්ශනික හා ප්‍රායෝගික වූ වෙනස් මාර්ගයක් අනුගමනය කර තිබේ.

ක්‍රිස්තියානි, මුස්ලිම්, හින්දු යනාදී සෑම දේවවාදී ආගමක ම මෝක්ෂය ලෙස හඳුන්වන්නේ දෙවියන් හා එක්වීම යි. වෛදික යුගයේ පටන් ම මෝක්ෂය සම්බන්ධ මෙම දේවවාදී නැඹුරුව අපට දැකිය හැකි ය. වෛදිකයන් පිතෘ ලෝකයට යෑම සඳහා දෙවියන් හා බමුණන් උදෙසා ඉෂ්ටාපූර්ත දනය පිදියයුතු වේ. [1] සාහ සංකල්පය හා බැඳුණු මෙම ඉෂ්ටාපූර්ත දනයෙන් අන්වර්ථවන්නේ වෛදිකයන් තම මෝක්ෂය ලෙස සැලකූ පිතෘ ලෝකයට නැතහොත් දේව ලෝකයට යෑම සඳහා දෙවියන් ප්‍රධාන නොවූනත් ඔවුන් සතුටු කිරීම අවශ්‍යව තිබුණු බව යි. උපනිෂද් යුගයේ දේවවාදී නැඹුරුව අඩුවී ගිය ද බ්‍රාහ්මණ යුගයේ බ්‍රහ්ම සංකල්පයත් සමග එය අලුත් මුහුණුවරකින් ස්ථාපිත විය. මොවුන්ගේ මෝක්ෂය වූයේ බ්‍රහ්ම සහව්‍යතාවය යි. [2] ඒ සඳහා මහාබ්‍රහ්මයා හොඳින් තබාගත යුතු ය. යාග හෝම හා තම කුලයට නියමිත රැකීරක්ෂාදියෙහි යෙදෙමින් බ්‍රහ්ම කැමැත්තට අනුව ජීවත්විය යුතු ය. [3] නූතන ක්‍රිස්තියානි



හා මුස්ලිම් වැනි ආගම්වල ද මොක්ෂ ගමන පිළිබඳ අවසාන තීරණය ස්ර්වබලධාරී දෙවියන් සතු වේ.

"මාර්ගය ද ජීවනය ද මා කරණකොට ගෙන මිස කිසිවෙක් පියාණන් වහන්සේ වෙතට පැමිණෙන්නේ නැත." (ශු : යොහාන් 14:6)

"මනුෂ්‍යයාගේ හදවත තුළට එතුමා දෙවියන් වහන්සේ ලෙස වැඩමකරමින් ශුද්ධාත්මයාණන් වහන්සේ තුළින් මනුෂ්‍යයාව ස්වර්ග රාජ්‍යයට ගෙනයන සේක. මෙය දෙ වන ආලෝකය වේ" [4]

ක්‍රිස්තුන් වහන්සේ නිතරම සඳහන් කරන්නේ තමන් මිනිසාගේ ගැලවුම්කාරයා බව යි. දෙවියන්ගේ මිහිපිට නියෝජිතයා වශයෙන් එතුමන්ට පව්කාරයන්ගේ පව් සෝදහැර ස්වර්ග රාජ්‍යයට පමුණුවාලීමේ හැකියාව ඇත. [5] මේ පිළිබඳ විග්‍රහයක යෙදෙන මහාචාර්ය හෙල්මන් වෝන් ගැලැස්මන් පවසන්නේ ලොව මැවීම, පැවැත්වීම හා පාලනය ද නීති දයකත්වය, විනිශ්වය හා උපකාරය ද එසේම ගැලවුම්කාරයා ද යන සියල්ල ම දෙවියන් වහන්සේ වන බව යි. [6] ශුද්ධ වූ කුරාණයේ එය මෙසේ ය.

"දෙව්ලොව සියල්ලත් මිහිකත සියල්ලත් අයිති කාහට ද? කියව, දෙව්පියාණන්ට බව කියව 'ඔහු දයාවේ (නීතිය) තමාට ම ලියානැඹූ සේ ඔබ සැවොම ඔබගේ ආත්ම විශ්වාස නොකළ ද ඔහු වෙත ඇදගනී" [7]

මේ අනුව දේවවාදී ආගම්වල දේවගමන නැතහොත් මෝක්ෂය රඳා පවතින්නේ පිටස්තර දෙවියකු මත ය. තම විමුක්තිය පිළිබඳ වගකීම දරන්නේ තමා නොව වෙනත් බාහිර කෙනෙකි.

බුදුදහමේ මෝක්ෂය යනු නිවන යි. සියලු කෙලෙස් නැති කිරීමෙන් එම තත්ත්වයට පත්විය හැකි ය. [8] සංසාරගත දුක්ඛයට හේතු වන්නේ මිනිස් සන්තානය තුළ පවත්නා තණ්හාව යි. [9] එහෙත් එය එකම හේතුව නොව ප්‍රධානම හේතුව යි.

තණ්හාව සඳහා පසුබිම වන්නේ අවිද්‍යාව යි. [10] මේ අනුව අවිද්‍යා, තණ්හා නිසා පුද්ගලයාගේ සංසාරගත දුක හටගනී යි. ඒ දුක නැතිකිරීම සඳහා තණ්හා: අවිද්‍යා දුරුකළ යුතු යි. [11] එසේර දුකට ප්‍රධානම හේතුව වන තණ්හාව සමුච්ඡේදනය කළ හැක්කේ ලෝකය පිළිබඳ යථාර්ථය වන අනිත්‍ය, දුක්ඛ, අනාත්ම යන ත්‍රිලක්ෂණානුකූල යථාභූත ඥාණදස්සනය

ඇතිකර ගැනීමෙන් ය. [12] එවිට ඒ පුද්ගලයා ඉපදීම නතර කළ, බඹසර වැස නිම වූ කළයුතු ද කොට අවසන් වූ තත්ත්වයට පත්වේ. [13] එහිදී ඔහු ක්ලේශ පරිනිර්වාණයෙන් සෝපධිසේස නිවනට පැමිණෙන අතර කෙලෙස් හා පඤ්චස්කන්ධය දෙක ම විනාශ කිරීමෙන් අනුපාදිසේස නිවනට නැතහොත් මෝක්ෂයට පත්වේ. [14] මේ අනුව බුදු දහමේ මෝක්ෂ මාර්ගය පැවරී තිබෙන්නේ තමන්ට ම ය. තම සන්තානය තුළ පවත්නා ක්ලේශ ධර්මයන් අවබෝධ ඥානයෙන් හා භාවනාවෙන් සමුච්ඡින්න කළ යුතු ය. සෝවාන්, සකෘදගාමි, අනාගාමි, අරහත් යන මාර්ග ඵල පිළිවෙළින් සකල ක්ලේශයන් ප්‍රහීන කොට නිර්වාණය ධාතුව අවබෝධ කරගත හැකි ය. [15] එහිදී භාග්‍යවතුන් වහන්සේ මාර්ගය කියාදෙනවා පමණි, එය අනුගමනය කොට මෝක්ෂ මාර්ගය ලබාගැනීම තමන් සතු ය. [16] එමනිසා බුදු හිමි බොහෝ අවස්ථාවල අවධාරණය කළේ තමන්ගේ සරණ තමන් අත බවත්, තම මෝක්ෂය සඳහා වෙන කිසිවෙක් පිහිට නොවන බවත් ය. [17] ඒ අනුව මානව කේන්ද්‍රීය දහමක් වන බුදුදහම මෝක්ෂය පිළිබඳ සියලු වගකීම් මිනිසාට පවරා තිබේ. එහි දී තමන්ට ඉහළින් තම ක්‍රියාවන් පාලනය කරන ඊශ්වරයකු, දෙවියකු නො මැති බව බුදුදහම තරයේ ම අවධාරණය කරයි. [18] බුදු හිමි වරක් දේශනා කළේ :

> 'ලෝකය ද ලෝක සමුදය ද ලෝක නිරෝධය ද ලෝක නිරෝධ මාර්ගය ද මේ බඹයක් පමණ වූ ශරීර කුඩුව තුළ ම පවතින බව යි.' [19]

එමනිසා මිනිසාගේ ඇතිවීම, පැවැත්ම හා මෝක්ෂය යන සියලු ප්‍රවෘත්ති ඔහු තුළ ම පවතී. එය බාහිර සර්ව බලධාරී දෙවියකු හෝ බඹකු හෝ විසින් කරන ලද්දක් නොවේ. මේ අනුව දේවවාදී ආගම් හා බුදුදහම අතර මෝක්ෂය සම්බන්ධව පවත්නා වෙනස අපට මනාව පැහැදිලි වේ. එසේම මෝක්ෂය සම්බන්ධ තවත් සුවිශේෂ ලක්ෂණයක් වන්නේ එහි පවත්නා සදාතනිකත්වය යි. දේව වාදී ආගම්වල මෝක්ෂය සදාතනිකත්වයෙන් සැලකේ. බෞද්ධ මෝක්ෂය වන නිවන සම්බන්ධයෙන් ද සදාතනික ස්වභාවයක් පෙන්නුම් කරන වචන භාවිතා වී ඇති අතර එය තාවකාලික වූ සංසාරයෙන් වෙන්කර පෙන්වීම සඳහා සිදුවූවක් බව පෙන්වාදිය හැකි ය. වෛදික යුගයේ පටන් ම දේව ලෝක සදාතනිකත්වයෙන් සලකා තිබුණි. [20] ක්‍රිස්තියානි, මුස්ලිම් වැනි ආගම්වල ද ස්වර්ගය මරණින් මතු ලබන සදාතනික තත්ත්වයකි. මේ දේවවාදීන්ගේ මෝක්ෂයේ සදාතනිකත්වය හා බැඳෙන අනිත් සංකල්පය නම් ආත්මවාදය යි. එනම් සර්වබලධාරී දෙවියන් විසින් මිනිසාට ආත්මය දෙන ලදී. මරණින් මතු එම ආත්මය



දෙවියන් හා එකතුවීම මෝක්ෂය වේ. ජෛනාගමය වැනි ආගම්වල ද ආත්මයක් පිළිගන්නා අතර එය සියලු කර්ම ගෙවා ක්ෂය කිරීමෙන් එයට හිමි තත්ත්වය වන සදාතනික 'සද්' බවට පත්වේ. ලෝකය මවන බලසම්පන්න දෙවියකු නැතත් කේවල බවට පත්වී යන ශුද්ධ ආත්මයෝ සිද්ධ ශාලාවේ දී එක ම පරමාත්ම සංඛ්‍යාත මහා දේවත්වයට පත්වන්නෝ ය.

බුදුදහම එබඳු ආත්මවාදයක් නොපිළිගනී. එය උච්ඡේද වාදයට හෝ භෞතික වාදයට නොවැටෙන්නේ එහි සංසාරය හා මෝක්ෂය උගන්වන බැවිනි. ආත්ම සංකල්පය මිනිස් හදවත් තුළ කෙලෙස් මළ පහළවීමට මූලික බීජය වේ. එනිසා බුදු හිමියන් මේ අනර්ථකාරී ආත්ම සංකල්පය එකහෙළා ම ඉවත් කරන්නට ඇතැයි අපට සිතීමට පුළුවන. මේ අදහස ගුණපාල ධර්මසිරි ද මැනවින් පෙන්වා දී ඇත. [21] එසේම නිවන සම්බන්ධයෙන් නිරෝධ, අනුප්පාද, අශාස්වත, ආදී නිෂේධාර්ථවත් පද භාවිතාකර තිබෙන්නේ සමකාලීන හින්දු දර්ශනික සම්ප්‍රදායයන් මගින් දක්වා තිබුණු පරමාත්මය වැනි දෘෂ්ටීන්ගෙන් මිනිස් සිත මුදවා යථාර්ථයට යොමුකිරීමට බව මූල මාධ්‍යමික කාරිකාවට අනුවද පැහැදිලි වේ. [22] ඒ අනුව බුදුදහමේ උගන්වන මෝක්ෂය සදාතනික අවිපරිනාමී ආත්මයකින් බාහිර වූ තත්ත්වයක් බව අපට පැහැදිලි වේ. නමුත් බුදුහිමි ආත්මය ප්‍රතික්ෂේප නොකළ බව රිස් ඩේවිඩ්ස් මැතිනිය දක්වන බව ටී. ආර් වී. මූර්ති මහතා සඳහන් කරයි. [23] නාගාර්ජුන හිමියන්ට අනුව බුදු හිමි ආත්මයක පැවැත්ම සමහර තැනක පිළිගනු ලබන්නේ භෞතික වාදයට විරුද්ධව කර්මය හා කර්ම ඵලය ඉස්මතු කිරීමට බව ද දක්වා තිබේ. [24] නමුත් මූර්ති මහතා ම බුදු හිමි ආත්ම අනාත්ම යන දෙක ම ප්‍රතික්ෂේප කළ බව නාගාර්ජුන පාදයන්ගේ මූල මාධ්‍යමික කාරිකාවේ එන 'ආත්මේත්‍යපි ප්‍රඥප්ති' යන ශ්ලෝකය ද උපයෝගී කරගෙන පෙන්වා දී තිබේ. ඒ අනුව බුදු හිමි ආත්මය සම්බන්ධයෙන් යම් ප්‍රතිශ්ධාර්ථයක් කථාකළේ හුදෙක් සමාජ සුචරිතය සඳහා බව කිවයුතු ය. එසේ නොමැතිව මිනිසා තුළ නිත්‍ය ස්ථාවර ... ශාස්වත අවිපරිනාමී ආත්ම පදර්ථයක් ඇති බව කිසියේත් බුදුදහම පිළිගන්නා නිසා නොවේ.[25] එය, පංචස්කන්ධ විභජනයෙන් පැහැදිලිව ම ප්‍රතික්ෂේප කර තිබෙන අ[illegible] ආදිත්තපරියාය – අනත්තලක්ඛණ – සච්චක වැනි සූත්‍රවලින් මනාව ප්‍රකට වේ. [26] මේ අනුව සෙසු දේවවාදී ආගම්වල පරම නිෂ්ඨාව වන ස්වර්ගයේ ඇති ආත්මවාදී ද්‍රව්‍යවාදී දෙක ම බෞද්ධ නිර්වාණයේ දක්නට නැත. බෞද්ධ නිර්වාණ තත්ත්වය උපමාකර තිබෙන්නේ නිවීගිය පහනකට ය. [27] එහි දැල්ල ගිය දිශාවක් තැනක් දක්විය නොහැකි සේ නිර්වාණගාමී පුද්ගලයා යන තැනක්

දක්වීම අපහසු ය.[28] එය අනිර්වචනීය වූ තත්ත්වයකි. පෙළ පොත්වල සුඤ්ඤත, අනිමිත්ත, අසංඛත, අජර, අමර, අජාත වැනි විවිධාකාර නිශේධාර්ථවත් පදවලින් හඳුන්වා තිබේ. එබඳු නම් තිස්තුනක් නාරාවිල ධම්මරතන හිමි දක්වා තිබේ.[29] එහෙත් එම විග්‍රහයන් වලංගු විය යුත්තේ අනුපධිශේස නිර්වාණය සම්බන්ධයෙන් පමණි.

පෙළ පොත්වල දක්වෙන නිර්වාණය සුඤ්ඤතය යන අදහස පශ්චාත්කාලීන මාධ්‍යමිකයන්ගේ දැඩි විග්‍රහයට භාජන වූයේ ය. ඔවුන් ප්‍රකාශ කරන්නේ බෞද්ධ මෝක්ෂයේ පවත්නා මෙම ශූන්‍යතාවය හිස් වූ උච්ඡේදයක් නො වන බව ය. ශූන්‍යතාව යනු සාපේක්ෂතාව බව ඔවුන්ගේ ඉගැන්වීම යි.[50] ඒ පිළිබඳ මොරටුවේ සාසනරතන හිමියන් මෙසේ දක්වා ඇත.

> ශූන්‍යතා ශබ්දයාගේ අර්ථය එතෙක් හීනයාන, බ්‍රහ්මණ, ජෛන ආචාර්යවරයන් ගත් සත්තාවයන්ගේ නිෂේධාර්ථයෙන් ගැනීමට නාගාර්ජුනට අභිමත නොවීය. මාධ්‍යමිකයන්ගේ ශූන්‍යතාව සාපේක්ෂතාර්ථයකි.

මේ අනුව මාධ්‍යමිකයන්ගේ ශූන්‍යතාව සාපේක්ෂතාව පදනම් කරගත්තකි. එය මූලික බුදුදහම හා පටිච්චසමුප්පාදය අනුව ගොඩනගා ගත්තකි. මේ නිසා ශූන්‍යතාව යනු හිස් බව නොව සාපේක්ෂතාව යි. සම්මුතිය පරමාර්ථයට ද නිවන සංසාරයට ද ආදී වශයෙන් ලොව සියල්ල ම සාපේක්ෂක ය. ශූන්‍ය ය. මේ අනුව නිර්වාණය යනු සංසාරයට සාපේක්ෂකව පවතින්නක් බව පැහැදිලි ය. එනිසා සුඤ්ඤත, අනිමිත්ත, අසංකත යනාදී නිෂේධාර්ථවත් පද ඒ සඳහා විශේෂණ වශයෙන් භාවිතා කළ පමණින් බෞද්ධ නිර්වාණය හිස් තත්ත්වයක් නොවේ. ටී. ආර්. වී. මූර්ති විසින් මාධ්‍යමිකයන් චතුෂ්කෝටියේ එන සියලු විසංවාදී අංශයන් ප්‍රතික්ෂේප කරනවා පමණක් නොව එමගින් ගම්‍යමාන මධ්‍ය ද ප්‍රතික්ෂේප කර ඇති බව සමාධිරාජ සූත්‍රය ද ඇසුරින් පෙන්වා දෙනු ලැබ ඇත.[31] ඇරිස්ටෝටල් ද තම තර්කයේ දී මධ්‍ය බහිෂ්කරණ රීතියෙන් (The Law of excluded middle.) විසංවාදි මතවලින් විද්‍යමාන මධ්‍ය තත්ත්වය ප්‍රතික්ෂේප කර ඇත. ඒ අනුව බෞද්ධ නිර්වාණය විසංවාදයක් නොවන අතර එය සම්පූර්ණයෙන් ඉන් පරිබාහිර වූවකි. එම නිසා එය නිෂේධාර්ථවත් හෝ ප්‍රතිෂේධාර්ථවත් පදවලින් විග්‍රහ කිරීමට අපහසු බව ප්‍රකාශ වෙයි. මේ අදහස මූලමාධ්‍යමික කාරිකාවේ විසිපස් වන නිර්වාණ පරීක්ෂා නම් කාණ්ඩයේ පහළොව, දසය, දහත යන් ශ්ලෝකවලින් ද තවත් මූර්තිමත් වේ.[32]



මේ නිෂේධාර්ථවත් පද භාවිතය නිසා බෞද්ධ මෝක්ෂය ජනශූන්‍ය හිස් ක්ෂේම භූමියක් වශයෙන් හැඟී ගියේ ය. එහි ප්‍රතිඵලයක් වූයේ බෞද්ධ ශ්‍රාවකයන් තුළ තමන්ට ශාස්තෘවරයෙක් නැත යන මානසික හිස් බවක් මෙන් ම අසරණ බවක් ද ඇතිවීම ය. එය ආගමික මනෝවෘත්තියට අනුව ආගමේ පසුබැමට හේතු විය. එනිසා මහායානිකයන් විසින් බුද්ධ, බෝධිසත්ව වැනි සංකල්ප දියුණු කරන ලද අතර සුඛාවතී දිව්‍යලෝකයක් ද නිර්මාණය කරන ලදී. මෙය සුඛාවතී ව්‍යුහ සූත්‍රයේ විස්තර වේ. බෝධිසත්ව වන්දනාව හා දිව්‍යලෝකස්ථ බුදුවරුන් පිළිබඳ සංකල්පය විසින් බුදුන් හා බෝසතුන් දේවත්වයට නංවනු ලබන බව නිනියන් ස්මාට් පවසයි.[33] මෙහි දී බුදු හිමියෝ කාය වශයෙන් තුනකට බෙදගන්නා ලදහ.[34]

I. නිර්මාණ කාය
II. සම්භෝග කාය
III. ධර්ම කාය

මේ ත්‍රිකාය සංකල්පය අනුව දිව්‍යලෝකය හා සම්බන්ධ වන්නේ බුදුරදුන්ගේ සම්භෝගය කාය යි. එනම් බුදුරදුන් දිව්‍යාලෝකයේ වැඩවසන අතර ම වරින්වර මනුලොව උපදින්නේ උන්වහන්සේගේ නිර්මාණ කාය වේ. නිර්මාණ කාය හා සම්භෝග කාය දෙක සැබවින් ම ව්‍යාජ වන අතර ඒවා සත්‍ය වූ ධර්ම කායයෙන් නිෂ්පාදනය වී පවතී යැයි මහායාන සූත්‍රාලංකාරය සඳහන් කරයි.[35] ඒ තත්ත්වය මහාචාර්ය සුසුකි මහතා ද මැනවින් පෙන්වා දෙයි.[36] ඒ අනුව මහායානිකයන් සම්භෝග කාය හා දිව්‍යලෝක සම්බන්ධ කරගෙන බෞද්ධ මෝක්ෂයට දේවවාදී ඌරුවක් හා පදනමක් ලබාදීමට උත්සාහ ගෙන ඇති අයුරු පැහැදිලි වේ. බුදුවරුන්ගේ දිව්‍යමය වාස භවන ලෝකෝත්තර භූමි ලෙස දක්වන්නේ ක්‍රිස්තු භක්තිකයන් දෙවියන් වසන තැන හා විමුක්තියේ නිෂ්ඨාව සේ දක්වන ස්වර්ගයට සමාන වන අයුරින් බව නිනියන් ස්මාට් පවසයි.[37] මේ ප්‍රවණතාව සුඛාවතිය හා අමිතාභ බුද්ධ සංකල්පය මගින් තවදුරටත් වර්ධනය වී යන ආකාරයක් අපට පැහැදිලිව දක්නට ලැබේ.[38] එහෙත් මහායානිකයන්ගේ බුද්ධත්වයට පත්වීම හා ක්‍රිස්තියානි ආගමේ දේව සහව්‍යතාව අතර විශාල වෙනසක් තිබේ. එනම් දේව සහව්‍යතාව යනු ස්වර්ගයේ දෙවියන් අතරට යෑම ය. එහෙත් මහායානික බුද්ධත්වයට පත්වීම යනු ඒ උතුම් තත්ත්වයට බැතිමතා ම පත්වීම යි. වෙනත් වචනයකින් කිව හොත් බැතිමතා ම බුදු වේ. දේවත්වය වෙත යොමු වන ගුණවාදී ප්‍රවණතා පාලනයට පෞරුෂේය ඊශ්වරයකු නොමැති හෙයින් පරමාර්ථ සත්‍යයට අනුව භක්තිමතකු වන්දනා කරන්නේ තමාගේ ම අනාගත ස්වරූපයට බව නිනියන් ස්මාට් වෙනත් වචනවලින් විග්‍රහ කොට ඇත.[39]

ථෙරවාදී බුදුදහම අනුව බෞද්ධ මෝක්ෂය වන නිවන සදාතනිකත්වයෙන් ගනු ලබන්නේ එය අසංඛතයක් වන නිසා ය. අසංඛත යනු හේතුඵල ධර්මයන්ගෙන් හට නොගත් ඒවා ය. හේතුඵල ධර්මයන්ගෙන් හටගත් සියලු දේ සංඛත වන අතර නිවනින් මෙහා ඇති කාමාවචර, රූපා වචර අරූපාවචර සමස්ත ලෝකය ම වෙනස් වේ. ඒ සංඛතයන්ගේ ලක්ෂණ තුනක් මෙසේ දක්වා ඇත. [40]

(I) උපත
(II) පැවැත්ම
(III) විනාශය

සියලු ම සංස්කාරයෝ අනිත්‍යත්වයට භාජනය වෙති. [41] ඒ අනුව බෞද්ධ දිව්‍ය ලෝක ද උප්පාද, ඨිති, භංග යන ලක්ෂණත්‍රයට යටත්ව පවතින බව අවධාරණය වේ. බොහෝ දෙවියන් තම ලෝකයන් සදාතනික සැපයෙන් යුක්ත වන බව සිතමින් සිටින බවත් බුදු කෙනකු ලොව පහළ ව අනිත්‍ය ධර්මය දේශනා කරන විට තම දිව්‍යලෝකයන් ද තාවකාලික බව වැටහී යාමෙන් ඔවුන් මහත් සන්ත්‍රාසයට භීතියට පත්වන බව සංයුක්ත නිකායේ සඳහන් වේ. [42] දෙවියන් දෙදෙනකු තව්තිසා දෙව්ලොව නන්දන වනයේ දී හමු වී එක් කෙනකු දෙව්ලොව සැප උසස් යැයි කියන අතර අනෙක් දෙවියා අරහන්ත වචනයට අනුව දෙව් සැප අනිත්‍ය යැයි පවසයි. [43]

බුදු හිමියන් බක බ්‍රහ්මයාට දේශනා කළේ බ්‍රහ්මලෝකයට ඉහළින් ආභස්සර, සුභකිණ්ණ සහ වේහප්ඵල යනුවෙන් තවත් දේවලෝක තුනක් තිබෙන බව ය. [44] එසේ ම ඔහු ආභස්සර ලෝකයේ ඉපිද සිටියේ ය. මින් අපට පැහැදිලි වන්නේ බක බ්‍රහ්මයා තමාගේ ලෝකය ලොව ඇති උසස් ම සදාතනික පරම නිෂ්ඨාව වශයෙන් සලකා වැජඹුණු බව ය. බුදු හිමියන්ගේ දේශනාවෙන් ඔහු තම මිථ්‍යා අදහස අත්හරි යි. බෞද්ධ මෝක්ෂයට කුසල් උපනිශ්‍රය වන අතර ස්වර්ගයට හේතු වන්නේ පින්කම් ය. පින් කිරීමෙන් දෙව්ලොවට යන පුද්ගලයා ඒ පින ක්ෂය වීමෙන් දෙව්ලොවින් චුත වේ. ඉන්පසු වෙනත් ලෝකයක කර්මානුරූපව උපදියි. දෙවියකු දෙව්ලොවින් චුතවන ආකාර රාශියක් දීඝ නිකාය අටුවාව දක්වා තිබේ. [45] ඒවා මෙසේ ය.

(I) ආයුෂ ක්ෂය වීමෙන්
(II) පින ක්ෂය වීමෙන්
(III) ආහාර නියමිත වේලාවට නොගැනීමෙන්
(IV) ඊර්ෂ්‍යා, ක්‍රෝධාදී අකුශල සිතිවිලි පහළ වීමෙන්



එසේම සංයුත්ත නිකායේ දෙවියන් චුත ව උපදින අවස්ථා (භව) හයක් ද දක්වා ඇත. [46]

එසේම දෙවියකු චුතවීමට ආසන්නයේ දී පහළ වන පූර්ව නිමිති රාශියක් ද සුත්තසංගහට්ඨකතාව දක්වා තිබේ. [47] ඒවා මෙසේ ය :

(I) මල් මැලවීම (මාලා මිලායන්ති)
(II) වස්ත්‍ර කිලිටි වීම (වත්ථානි මිලායන්ති)
(III) කිහිලිවලින් දහඩිය පිටවීම (කච්ඡේහි සෙද මුච්චන්ති)
(IV) කය දුර්වර්ණ වීම (කායෙ දුබ්බණ්ණියං ඔක්කමති)
(V) තම දිව්‍යාසනයෙහි නොඇලීම (සකෙ දෙවො දෙවාසනෙ නාභිරමති)

මේ කරුණු අනුව දිව්‍යලෝක බෞද්ධ විග්‍රහය වන්නේ ඒවා සෙසු ලෝක මෙන් ම අනිත්‍යයට යටත්වන බව ය. එහි ආයුෂ ප්‍රමාණ සෙසු ලෝකවලට වඩා දීර්ඝ වුවද ඒවා සදාතනික නොවේ. එනිසා බෞද්ධයන් ප්‍රාර්ථනා කළ යුත්තේ තාවකාලික වන දේව සැප නොව සදාතනික වූ නිවන යි. මාරසිංහ මහතා පෙන්නා දෙන්නේ ද පෙළෙහි පැහැදිලිව ම බුදුරදුන්ගේ අනුශාසනාව වන්නේ නිවන පිණිස ම මිස දෙව් සැප පිණිස නොවන බව ය.[48] ඒ අනුව නිවන ලොව ඇති උතුම් ම සැපත වේ. [49] එහෙත් ඒ නිර්වාණය සාක්ෂාත් කරගැනීමේ අනුපූර්ව ප්‍රතිපදාවේ ස්වර්ගයට ද වැදගත් ස්ථානයක් ලබාදී ඇත. බුදු හිමියෝ එක්වර ම නිවන වැනි ගැඹුරු දහමක් තම ශ්‍රාවකයන්ට දේශනා නොකළ හ. එහිදී උන්වහන්සේ අනුගමනය කළේ ශ්‍රාවකයාගේ බුද්ධි මට්ටම අනුව අනුපූර්ව ප්‍රතිපදාවකි. එය :

(I) දාන කථා
(II) සීල කථා
(III) සග්ග කථා
(IV) කාමාදීනව
(V) නෙක්ඛම්ම ආනිසංස [50]

දන් දීමට පෙලඹෙන පුද්ගලයාට බුදු හිමියෝ සීලය දේශනා කරති. [51] ඉන් පසු ඔහු ස්වර්ග සැපතට යොමු කරයි. ඉන් පසු ස්වර්ගයේ පවත්නා අනිත්‍ය ස්වභාවය පෙන්නා දෙයි. එය විස්තර කරන දීඝනිකාය අටුවාව ඇතෙකු මනාව අලංකාර කොට උගේ සොඬ සිඳ දමන්නා සේ කාමාදීනව දක්වා සිත නෙක්ඛම්මය දෙසට යොමුකරවයි. [52] ඉන් පසු පැවිද්දේ ආනිශංස කියා පුද්ගලයා ක්‍රමානුකූලව විමුක්තිය දෙසට යොමු කරයි. මේ අනුව මිනිස් සිත නිවන් මගට යොමු කිරීමට යොදගත් සම්‍යක් ප්‍රයෝගයක් වශයෙන් ස්වර්ගය පිළිබඳ කථාව හඳුන්වා දීමට පිළිවන.

සමකාලීන ඉන්දියාවේ පැවති පාරභෞතික ස්වර්ග සංකල්පය බුදුරදුන් ඉතාම මැනවින් නිර්වාණ මාර්ගය වෙත උපයෝගී කැරගත් ආකාරය මින් මනාව පැහැදිලි වේ.

එහෙත් ස්වර්ගය ද සංසාර ප්‍රවාහය තුළ ම පවතින්නකි. පින් දහම් කරන සදචාරවත් පුද්ගලයා ස්වර්ග සම්පත් ලබයි. [53] එහෙත් එය දේවවාදී ආගම්වල මෙන් පරම නිෂ්ඨාව නොවේ. ප්‍රාර්ථනා කළත් නොකළත් කර්මානුරූපව ලැබෙන්නකි. බෞද්ධ මෝක්ෂය වන නිවන උත්සාහයෙන් හා ප්‍රාර්ථනයෙන් කෙලෙස් ක්ෂය කිරීමෙන් ලැබිය යුත්තකි. ඊට ප්‍රායෝගික හා මනෝවිද්‍යාත්මක පදනමක් ඇත. එහි මුල් අත්තිවාරම සීලය යි. එනම් කය, වචන දෙකේ සංවරය යි. සීලය නමැති අත්තිවාරම උඩ පිහිටා චිත්ත ප්‍රඥ දෙක වැඩිය යුතු යි. [54] ඒ අවස්ථා දෙක ආර්යාෂ්ඨාංගික මාර්ගයේ සමාධි, ප්‍රඥ වශයෙන් විස්තර කර ඇත. සමාධි අංශයේ දී සිදුවන්නේ චිත්ත ඒකාග්‍රතාව යි. පළමු වන ධ්‍යානයෙන් පංච නීවරණ යටපත් වෙයි.[55] ඉන් පසු විතක්ක, විචාර, පීති, සුඛ, ඒකග්ගතා යන කොටස් පිළිවෙළින් නැතිවී ගොස් සතර වන ධ්‍යානයේ දී ඉතිරි වනුයේ උපේක්ෂා ඒකාග්‍රතා දෙක පමණි. මේ සිව් වැනි ධ්‍යාන අවස්ථාව වන විට පුද්ගලයාගේ සිත වහා එකඟ කරගත හැකි පරිදි දියුණු මට්ටමකට පත්ව තිබේ. ඉන් පසු ඔහු සිත යොමුකළ යුත්තේ විදර්ශනාව දෙසට යි. එවිට ඉතිරිව තිබෙන දස සංයෝජනයන් ක්‍රමානුකූලව නැතිකර ගත හැකිය. [56]

මජ්ඣිම නිකායේ ආඛංකෙය්‍ය සූත්‍රයේ මුල් ම පියවර වන සෝවාන් තත්වයේ දී සංයෝජන තුනක් ක්ෂය වන බව දක්වා ඇත. [57] ඒවා සක්කාය දිට්ඨි, විචිකිච්ඡා, සීලබ්බතපරාමාස වශයෙන් රතන සූත්‍රයේ දී දැක්වේ. [58] මජ්ඣිමනිකාය අටුවාවෙන් ද එය අනුමත වී ඇත. [59] සකෘදගාමී වන විට කාමරාග, ව්‍යාපාද දෙක ද තුනී වේ. අනාගාමී වන විට කාමරාග ව්‍යාපාද ,සම්පූර්ණයෙන් ම නැතිවේ. එවිට පංච ඔරම්භාගීය කෙලෙස් සියල්ල ක්ෂය වේ. ඉන් පසු උද්ධම්භාගීය ක්ලේෂයන් වන රූපරාග, අරූපරාග, මාන, උද්ධච්ච, අවිජ්ජා යන පහ නැතිකිරීමෙන් අර්හත්වයට පත්වේ. සංයුත්ත නිකායේ නීවරණ සුත්ත, ඔරම්භාගිය සංයෝජන සුත්ත, උද්ධම්භාගිය සංයෝජන සුත්ත යන තැන්වල මේ පංච නීවරණ හා දස සංයෝජන ප්‍රහාණය කළ යුතු බව මැනවින් දක්වා තිබේ. [60] ඒ අනුව බෞද්ධ නිර්වාණ මාර්ගය තුළ පවත්නා ප්‍රායෝගික හා මනෝවිද්‍යාත්මක ස්වරූපය මනාව පැහැදිලි වේ. බුදුදහමේ අවසාන විමුක්තිය ගෙනදෙන්නේ ආත්ම ශික්ෂණයකට අදාළ ක්‍රම පද්ධතියකින් බව ඊ.ජේ.තෝමස් පවසයි. [61] අන් ආගම්වල



ඉගැන්වෙන ස්වර්ගය මරණින් මතු යායුතු තැනකි. එහෙත් බෞද්ධ නිවන මෙලොව දී ම ලැබිය හැකි ප්‍රායෝගික තත්ත්වයකි. නිවන දකින්නට මැරෙන තුරු බලා සිටීමට අවශ්‍ය නැතැයි වල්පොල රාහුල හිමි පෙන්නා දෙයි.[62] එය මිනිස් මොළය තුළ පවතින්නක් බව ලබුදූවේ සිරිධම්ම හිමි සංයුත්ත නිකායේ දේවතා සංයුත්තයේ සර සූත්‍රය අනුව පෙන්වා දෙයි. [63]

බුදුදහමේ ඉගැන්වෙන නිවන පාරභෞතික, පාරලෞකික හා පංචස්කන්ධ නිෂේධනයෙන් අනුපදිශේෂ ව ලැබිය යුතු අනිර්වචනීය අතාර්කික තත්ත්වයක් ලෙස විවරණය කිරීම සම්පූර්ණයෙන්ම සාවද්‍ය වේ. බෞද්ධ නිර්වානයේ අධිභෞතික ස්වභාවය වඩාත් ඉස්මතු වූයේ ඒ පිළිබඳ නිශේධනාත්මක පද භාවිතය කෙරෙහි පමණක් අවධානය යොමු කිරීම නිසා ය. නිවනේ ප්‍රතිජානනාත්මක විවරණයන් අධ්‍යයනය කිරීමෙන් බෞද්ධ නිවන මෙලොව දී ම අත්විදිය යුතු සාංදෘෂ්ටික අනුභූතියක් බව පසක්වනු ඇත.

## පාදක සටහන්

(1) සේනාධීර ජී. සෘග්වේද ප්‍රදීපය 23 පි. පෙරමුණ මුද්‍රණාලය 1954
සංගච්ඡස්ව පිතෘභි : සංයමෙනෙෂ්ටාපූර්තෙන පරමෙ ව්‍යෝමන්
හිත්වායාවද්‍යං පුනරස්තමෙහි සංගච්ඡස්ව තන්වා සුවර්චා :

(2) ඡාන්දෝග්‍ය උපනිෂද් 4. 15. 6 ආර්. ඊ. හියම් ගේ ඉංග්‍රීසි පරිවර්තනය
Thirteen principal upanisads, England, Second Edition 1877.

(3) ධම්මරතන හිමි එන්. භාරතීය දර්ශන 54 පි. මහනුවර දෙවන මුද්‍රණය 1950

(4) ජේසු ජීවමානයි සහරාව ජුලි, අගෝස්තු කලාපය 5 – 97 පි. කොළඹ, 1996

(5) The Buddha and christ as Religious teachers by Silva, L. D. P2, Wheel Pablications, No 380, Colombo 10, 1992.

(6) Glasenapp, H. Von. Baddhism and christianity. P 11, Wheel Publications, No 16, Kandy, 1973.

(7) The Holly Quran, P 292, VOL. I P 291 – 292 by A yusaf Ali, Murry printing company New york, 1946.
"Say " To whom belongeth all that is in the heavens, and on earth say, to god he hath inscribed, for himself (the rule of mercy) that he will gather you, together for the day what ever, their own Souls that will not believe."

(8) සංයුත්තනිකාය 5, 270 පි. බුද්ධජයන්ති සංස්කරණය,
'යො තස්සායෙව තණ්හාය අසෙසවිරාගනිරෝධො චාගො පටිනිස්සග්ගො මුත්ති අනාලයො'

(9) සංයුත්තනිකාය 5, 270 පි. බුද්ධජයන්ති සංස්කරණය,
'යායං තණ්හා පොනොභවිකා නන්දිරාග සහගතා තත්‍ර තත්‍රාභිනන්දනී සෙය්‍යාථිදං කාම තණ්හා භවතණ්හා විභවතණ්හා'

(10) මජ්ඣිමනිකාය 612 පි. මහාතණ්හාසංඛය සූත්‍රය බුද්ධජයන්ති සංස්කරණය
'අවිජ්ජා පච්චයා සංඛාරා, සංඛාරපච්චයා විඤ්ඤාණං......වේදනා පච්චයා තණ්හා ......'

(11) ධම්මපදට්ඨකථා II 598 පි. හේවාවිතාරණ මුද්‍රණය
'යථාපි මූලෙ අනුපද්දවේ දළ්හෙ ඡින්නො'පි රුක්ඛෝ පුනරෙව රූහති එවම්පි තණ්හානුසයෙ අනූහතේ නිබ්බත්තතී දුක්ඛමිදං පුනප්පුනං'

(12) ධම්මපදට්ඨකථා II 540 පි. හේ.වි. මු.
 'සබ්බේ සංඛාරා අනිච්චාති යද පඤ්ඤාය පස්සති
 අථ නිබ්බින්දති දුක්ඛෙ එසමග්ගො විසුද්ධියා'
(13) දීඝනිකාය I 240 පි. බුද්ධජයන්ති සංස්කරණය
 'ඛීණා ජාති වුසිතං බ්‍රහ්මචරියං. කතං කරණීයං නාපරං ඉත්තත්ථායාති අබ්භඤ්ඤාසි,'
(14) ධම්මානන්ද හිමි වී. 201 පි. සම්බුද්ධ දේශනාව චරිතය හා තත්කාලීන සමාජය කොළඹ 10. 1968
(15) ඤාණසීහ හිමි එච්. මහරතන් වහන්සේ II පි. කොළඹ 10. 1962
(16) ධම්මපදය 218 පි. 'මග්ග වග්ගය' සිරි සීවලී බී. සංස්කරණය, කොළඹ 1961.
 'තුම්හෙහි කිච්චං ආතප්පං අක්ඛාතාරෝ තථාගතා
 පටිපන්නා පමොක්ඛන්ති ඣායිනො මාරබන්ධනා'
(17) දීඝනිකාය III 158 පි. බුද්ධජයන්ති සංස්කරණය
 'අත්තදීපා විහරථ භික්ඛවෙ අත්තසරණා අනඤ්ඤ සරණා'
(18) මජ්ඣිමනිකාය II 442 පි. රට්ඨපාල සූත්‍රය
 'අත්තානො ලොකො අනභිස්සරො'
(19) සංයුත්තනිකාය 1 120 පි. 'රොහිතස්ස සූත්‍රය' බුද්ධජයන්ති සංස්කරණය
 'ඉමස්මිංයෙව බ්‍යාමමත්තෙ කලෙබරෙ ලොකං ච පඤ්ඤපෙමි ලොකසමුදයං ච පඤ්ඤපෙමි, ලොක නිරෝධං ච පඤ්ඤපෙමි, ලොකනිරෝධගාමිනිං පටිපදං ච පඤ්ඤපෙමි'
(20) ඍග්වේද සංහිතා Viii 48. 3 භට්ටාචාර්ය තුමා ඖන්ද නගරය 1940
(21) Gunapala, D. A Buddhist Critique of the christian Concept of God, P28," God and Soul" Singapore, second Edition, 1974.
(22) මූලමාධ්‍යමික කාරිකාව 113 පි. සාසනරතන හිමි එම්. අනුලා මුද්‍රණාලය 1961 කොළඹ 10.
 'අනිරෝධමනුත්පාද මනුච්ඡේදමසාශ්වතං
 අනෙකාර්ථ මනානාර්ථ මනාගමමනිර්ගමම්
 යඃ ප්‍රතීත්‍යසමුත්පාදං ප්‍රපඤ්චොපශමං ශිවං
 දෙශයාමාස සම්බුද්ධස්තං වන්දෙ වදතාං වරං'
(23) Murti T. R. V. Central philosophy of Buddhism, P 21, London, 1954.
(24) Murti T. R. V. Central philosophy of Buddhism. P 21, London, 1954.
 " according to Nagarjuna Buddha has
 affirmed the existence of the Atman,
 against the materialist for there is
 the continuity of Karma and its result."
(25) මජ්ඣිමනිකාය I 342 පි. 'අලගද්දූපම සූත්‍රය' බු.ජ.ස.
 'නිච්චො ධුවො සස්සතො කුටට්ඨො එසකට්ඨායී ඨිතො අවිපරිනාම ධම්මො'
(26) මජ්ඣිමනිකාය I 548 පි. 'සච්චක සූත්‍රය' බු. ජ. ස.
(27) සුත්තනිපාතය 70 පි. 'රතන සූත්‍රය' බුද්ධජයන්ති සංස්කරණය
 'නිබ්බන්ති ධීරා යථායං පදීපො'
(28) ගුණසේකර ඒ. සොදුරුනද මහකව, 17 සර්ගය, මොඩන් පොත් සමාගම නුගේගොඩ 1966
 28. දීපො යථා නිර්වෘතිමභ්‍යුපෙතො
 නෛවාවනිං ගච්ඡති අන්තරීක්ෂං
 දිශං න කාඤ්චිත් විදිශං න කාඤ්චිත්
 ස්නේහක්ෂයාත් කේවලමෙති ක්ෂාන්තිම්
 29. එවං කෘතී නිර්වෘතිමභ්‍යුපෙතො – නෛවාවනිං ගච්ඡති නාන්තරීක්ෂං
 දිශං න කාඤ්චිත් විදිශං න කාඤ්චිත් – ක්ලේශක්ෂයාත් කෙවලමෙති ක්ෂාන්තිං
(29) ධම්මරතන හිමි එන්. භාරතීය දර්ශන 97 පි. මහනුවර 2 වන මුද්‍රණය 1950.
(30) මූලමාධ්‍යමික කාරිකාව 59 පි. සාසනරතන හිමි එම්. කොළඹ 10. 1961
(31) Murti T. R. V. Central philosophy of Buddhism. P 129. London, 1954.
 'අස්ති නාස්ති උභොපි අන්තා – සුද්ධි අසුද්ධි ඉමෙපි අන්තා
 තස්මාත් උභො අන්තා විවර්ජයිත්වා – මධ්‍යෙපි ස්ථානං න කරොති පණ්ඩිතාඃ'



(32) මූලමාධ්‍යමික කාරිකාව 25 කාණ්ඩය, සාසනරතන හිමි ඇම්. අනුල මුද්‍රණාලය, කොළඹ 10, 1961
(33) 'බුද්ධ කෘත්‍ය හා ක්‍රිස්තු කෘත්‍ය', තිතියන් ස්මාට්, ශ්‍රී චන්ද්‍රමුනි ආශිර්ලේඛා 100 පි. 1985
(34) පඤ්ඤාලෝක හිමි ඩබ්. 'මහායානයේ විශිෂ්ට සිද්ධාන්ත,' ප්‍රඥප්ජලී 146 පි. 1988
(35) ප්‍රඥප්ජලී 148 පි. 'මහායානයේ විශිෂ්ට සිද්ධාන්ත'
 'සමඃ සූක්ෂ්මශ්ච තච්ජිෂ්ඨඃ – කායං ස්වභාවිකො මතඃ
 සම්භොග විභුතා හේතුර් – යථෙෂ්ටං භොග දර්ශනෙඃ
 (මහායාන සූත්‍රාලංකාරය)
(36) Suzuki. T. D. Outlines of Mahayana Buddhism, P245, London, 1907.
 "Though they are conceived as three
 They are infact all Manifestations
 of One Dharmakaya"
(37) Kenryu Tsukinowa, "Amita" Encyclopaedia of Buddhism, p 434, VOL. I Fascicle 3. published by the government of Ceylon, 1964.
(38) ශ්‍රී චන්ද්‍රමුනි ආශිර්ලේඛා 100 පි. 1985.
(39) එම 103 පි.
(40) අංගුත්තර නිකාය 1, 274 පි. 'තික නිපාතය' බුද්ධජයන්ති සංස්කරණය
(41) ධම්මපදය 218 පි. මාර්ග වර්ගය 'සබ්බෙ සංඛාරා අනිච්චා' සිරි සීවලී සංස්කරණය කොළඹ, 1961.
(42) අංගුත්තර නිකාය 11, 68 පි. බුද්ධජයන්ති සංස්කරණය
 'යෙපි තෙ භික්ඛවෙ දෙවා දීඝායුකා වණ්ණවන්තො සුඛ බහුලා උච්චේසු විමානෙසු චිරට්ඨිතිකා තෙපි බො තථාගතස්ස ධම්මදෙසනං සුත්වා යෙභුය්‍යෙන භයං සංවෙගං සංතාපං ආපජ්ජන්ති අනිච්චා වා කිර භො මයං සමානා නිච්චමහාති අමඤ්ඤිම්හා'
(43) සංයුත්ත නිකාය 1, 11 පි. බුද්ධජයන්ති සංස්කරණය
(44) මජ්ඣිම නිකාය 1, 770 පි. 'බ්‍රහ්මනිමන්තනික සූත්‍රය' බුද්ධජයන්ති සංස්කරණය
(45) දීඝනිකාය අටුවාව 1, 78 – 81 පි. හේවාවිතාරණ මුද්‍රණය.
(46) සංයුත්ත නිකාය V, 352 – 354 පි. බුද්ධජයන්ති සංස්කරණය
(47) සුත්තසංගහට්ඨකථා 102 පි. බද්දේගම පියරතන නාහිමි සංස්කරණය, ත්‍රිපිටක මුද්‍රණාලය, කොළඹ 1929
 'පඤ්චස්ස පුබ්බනිමිත්තානි පාතුභවන්ති. තස්ස උපට්ඨිත මරණස්ස පඤ්චපුබ්බනිමිත්තානි උප්පජ්ජන්ති. පකායානි වා හොන්ති'
(48) Marasinghe M. M. J. Gods in Early Buddhism, P 137. Kelaniya, 1974.
(49) ධම්මපදය, 'සුඛ වර්ගය' 'සිරි සීවලී හිමි බී. මැකලම් ප්‍රෙස්, කොළඹ 1961
 'නිබ්බානං පරමං සුඛං'
(50) දීඝනිකාය 11, 66 පි. බුද්ධජයන්ති සංස්කරණය 'මහාපදාන සූත්‍රය'
 'දානකථං, සීලකථං, සග්ගකථං, කාමානං ආදීනවං, ඕකාරං, සංකිලෙසං, නෙක්ඛම්මෙ ච ආනිසංසං පකාසෙසි'
(51) දීඝනිකාය අටුවාව 321 පි. හේවාවිතාරණ මුද්‍රණය.
 'යස්මා පන දානං දදන්තො සීලං සමාදාතුං සක්කොති තස්මා තදනන්තරං සීලකථං කථෙසි'
(52) දීඝනිකාය අටුවාව 321 පි. හේවාවිතාරණ මුද්‍රණය.
 'එවං සග්ගකථාය පලොභෙත්වා පුන හත්ථිං අලංකරිත්වා තස්ස සොණ්ඩං ඡින්දන්තො – විය අයංම්පි සග්ගො අනිච්චො අද්ධුවො-න එත්ථ ඡන්දරාගො කාතබ්බොති දස්සනත්ථං'
(53) විමානවත්ථු බුද්ධජයන්ති සංස්කරණය 305 පි.
(54) විශුද්ධිමාර්ගය 1 පි. නන්දාරාම හිමි බ. සංස්කරණය, මාතර 1955
 'සීලෙ පතිට්ඨාය නරො සපඤ්ඤො චිත්තං පඤ්ඤං ච භාවයං'
(55) රාහුල හිමි ඩබ්. 'බුදුන් වදාළ ධර්මය' 69 පි. කොළඹ 1975
(56) අංගුත්තර නිකාය Vi, 32 පි. දස සංයොජන බුද්ධජයන්ති සංස්කරණය
(57) මජ්ඣිම නිකාය 1, 78 පි. බුද්ධජයන්ති සංස්කරණය